# ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය කෙරෙහි බලපෑම් කරනු ලබන සාධකයන්හි ප්‍රවණතාවය විමසීම.

එල්. එල්. ආර්. ලොරෙන්සුහේවා[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වන අතර මෙහි ප්‍රධාන යැපුම් භෝගය ලෙස "වී" දැක්විය හැකිය. ශ්‍රී ලංකාව තුළ වී නිෂ්පාදනය මහා පරිමාණයෙන් සිදුවන අතර වී නිෂ්පාදනය නගා සිටුවීමේ දී ඒ සඳහා බලපාන සාධකයන්හි ප්‍රවණතාවය විමසීම මෙහි අරමුණ විය. ඒ සඳහා යොදාගත් සාධක වූයේ භූමිය, පොහොර භාවිතය, ණය ආධාර යනාදියයි. මෙම අධ්‍යයනය සඳහා ද්විතීක දත්ත භාවිතා කරන ලද අතර මහ බැංකුව විසින් නිකුත් කරන ලද Economic and social statistics of Sri Lanka 2014 වාර්තාවෙන් දත්ත ලබා ගන්නා ලදී. ලබා ගත් දත්තයන් 2004-2013 කාල සීමාවට අයත් වන ලෙස තෝරා ගැනුණි. එහි දී දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිත කළ අතර බහුගුණ ප්‍රතිපායන ආකෘති ක්‍රමය ද යොදා ගන්නා ලදී. මෙහිදී වී නිෂ්පාදනය කෙරෙහි එක් එක් සාධකය දක්වන දායකත්වය වෙන වෙනම මෙම අධ්‍යයනය තුළින් සොයා බලනු ලැබිණි. එමගින් අනාවරණය වූයේ, වැඩිම දායකත්වයක් සපයන සාධකය වන්නේ, භූමිය බවයි. එනම්, භූමිය එක් ඒකකයකින් වැඩි කරන විට වී නිෂ්පාදනය 2.9කින් වැඩි වන බව නිගමනය කළ හැකි විය. එමෙන්ම අනෙකුත් සාධක ස්ථාවර විට දී, පොහොර භාවිතය එක් ඒකකයකින් වැඩි කරන විට වී නිෂ්පාදනය 1.538කින් වැඩි වන බවත්, ණය ආධාර එක් ඒකකයකින් වැඩි කරන විට වී නිෂ්පාදනය 0.015කින් වැඩි වන බව නිගමනය විය. වී නිෂ්පාදනය වැඩි වන විට රජයේ ආදායම ද වැඩි කර ගත හැකි බැවින් රජය විසින් අනෙකුත් සාධක ද ක්‍රමවත්ව සහ පිරිවැය අවම වන පරිදි භාවිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය යන්නත්, ගොවීන් ඊට දායකත්වයක් ලබා දිය යුතුය යන්නත්, මෙහි දී යෝජනා ලෙස ඉදිරිපත් කළ හැකිය.

**මුඛ්‍ය පද :** වී නිෂ්පාදනය, සාධක, භූමිය, පොහොර භාවිතය, ණය ආධාර

1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
rangani22lorensuhewa@gmail.com